Department of
Social Statistics,
University of
Kelaniya
DOSS_2012/2013
SS/2012/0765

# ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අධ්‍යාපනය, සාඵල්‍යතාවය කෙරෙහි ඇති කරන බලපෑම

බී.එම්.එන්.එම් තිලකරත්න

**සංක්ෂේපය**

1981-2012 කාලපරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධන වේගය 1.1%ක් ලෙස වාර්තාවන අතර 1960 සිට මෙරට උපත් අනුපාතිකය පහළ යාමක් හඳුනාගත හැකිය. විවිධ රජයන් විසින් රටපුරා පාසල් ඇතිකිරීම, නොමිලේ අධ්‍යාපනය ලබා දීම, නොමිලේ නිල ඇඳුම් සහ පොත්පත් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඒ තුළින් රටේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාමක් මෙන්ම කාන්තාවන්ගේ අදහස්වලට ගරු කරන සමාජයක්ද බිහිවිය. කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම තුළින් ද්විතීයික අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනය කෙරෙහි කාන්තාවන් යොමුවීමේ ඉහළ ප්‍රවණතාවක් දක්නට ලැබේ. ඒ තුළින් කාන්තාවන් තම විවාහය පිළිබදවත් ප්‍රජනනය පිළිබඳවත් ස්වාධීන තීරණ ගැනීමක් දක්නට ලැබේ. එබැවින් කාන්තාවන්ගේ අධ්‍යාපනය සඵල්‍යතාවය කෙරෙහි බලපෑමක් ඇති කරන්නේද යන්න විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යනය සිදු කරන ලදි. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අධ්‍යාපනය සඵලතාවය කෙරෙහි ඇතිකරන බලපෑම අධ්‍යනය  කිරීම යන මූලික අරමුණත් අධ්‍යාපන මට්ටම් අනුව සාඵල්‍යතාවයෙහි වෙනස්වීම හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහය අනුව සඵල්‍යතාවයෙහි වෙනස්වීම අධ්‍යයනය කිරීම යන උප අරමුණුත් පාදක කොට ගනිමින් සමීක්ෂණය සිදු කළ අතර ඒ සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් කාන්තාවන් 50කින් යුක්ත සසම්භාවී නියැදියකින් ප්‍රශ්නාවලිය ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කළ අතර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා විභාග දෙපාර්තමේන්තුවල වාර්තාවන්ගෙන් ද්විතීයික දත්තද රැස්කර ගන්නා ලදි. ඉහත ක්‍රමවේද මගින් ලබාගත් දත්ත SPSS පරිගණක මෘදුකාංගය භාවිතය මඟින් විශ්ලේෂණයට භාජනය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව පෙනීගිය කරුණු වූයේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම සහ සඵල්‍යතාවය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතින බවයි. විශේෂ කරුණක් වශයෙන්, අධ්‍යයනයට භාජනය කළ ප්‍රජනන වයස් කාණ්ඩවල සිටින සියලුම කාන්තාවන් තුළ (වයස අවුරුදු 15-49), විංග්‍රාහක ක්‍රම සහ පවුල් සැලසුම් ක්‍රම පිලිබඳව ඇති දනුවත්භාවය දැක්විය හැකිය. කාන්තාවන්ගේ සාමාන්‍ය විවාහවන වයස අවුරුදු 24 බවත් ඉහළ අධ්‍යාපන මට්ටමක් ඇති කාන්තාවන් අතර විවාහ වන වයස ප්‍රමාදවීමේ ප්‍රවණතාවක් පවතින බවද හඳුනා ගැනිණි. අවුරුදු 28 ට පෙර විවාහ වූ කාන්තාවන්ගේ සඵල්‍යතාවය අනෙකුත් කාන්තාවන්ට සාපේක්ෂව ඉහළ බවද දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය විය. මේ අනුව ශ්‍රී ලංකාවේ උපත් අනුපාතිකය පහළ බැසීමට ප්‍රධාන හේතුවක් ලෙස කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම බලපාන බව කිවහැකිය.

**මුඛ්‍ය පද:** ***සාඵල්‍යතාවය, අධ්‍යාපනය, ජනගහනය, කාන්තාවන්***

---

medhya8@gmail.com